
# 4 ශ්‍රී ලංකාවේ පිහිටීම

ශ්‍රී ලංකාව, ඉන්දියන් සාගරයේ ඉන්දියාවට දකුණින් පිහිටා ඇති දූපතකි. එය ලෝකයේ විශාලතම මහාද්වීපය (continent) වන ආසියා මහාද්වීපයට අයත් වේ. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් වෙන් වන්නේ පටු මුහුදු තීරයකිනි. 32kmක් පමණ වූ මෙම මුහුදු තීරය පෝක් සමුද්‍ර සන්ධිය (Palk strait) නමින් හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ පිහිටීම හා ඒ අනුව ඇති වී තිබෙන විවිධ බලපෑම් පිළිබඳ ව අවබෝධයක් ලබාදීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව, එහෙත් වෙන් ව පිහිටා තිබීම නිසා අනන්‍ය වූ දේශගුණික, දේශපාලනික හා ආර්ථික ලක්ෂණවලින් සමන්විත වේ. (4.1 සිතියම)




**4.1 සිතියම**
**ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව දූපතක් ලෙස පිහිටීම**

# ශ්‍රී ලංකාවේ පිහිටීම,

## දේශගුණයට බලපාන ආකාරය

- දූපතක් ලෙස පිහිටීම නිසා ඉන්දියන් සාගරයේ සිට හමන සුළං මගින් උෂ්ණත්වය සමනය වීම හා වර්ෂය මුළුල්ලේ ම වාගේ වර්ෂාව ලැබීම.
- ඉන්දියානු උප මහාද්වීපයේ සිට හමා එන වියළි සුළංවල බලපෑම නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ යාම.
- මෝසම් සුළංවල බලපෑමෙන් වර්ෂාව ඇති වීම

## ආර්ථිකයට බලපාන ආකාරය

- ශ්‍රී ලංකාව අතීතයේ දී මෙන් ම වර්තමානයේ ද පෙර අපර දෙදිග නැව් මාර්ගයේ මධ්‍යස්ථානයක් වීම.
- ශ්‍රී ලංකාවේ වරායන් ජාත්‍යන්තර වෙළෙඳාමේ දී වැදගත් වීම.
- ආකර්ෂණීය ස්ථාන (attractive places) තිබීම නිසා සංචාරක කර්මාන්තය (Tourist industry) දියුණු වීම.
- බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් නව ආර්ථික රටා බිහි වීම.

## සංස්කෘතියට බලපාන ආකාරය

- ඉන්දියාව, අරාබිය වැනි රටවලින් විවිධ ජන සමූහ සංක්‍රමණය වීම නිසා විවිධ ජනවර්ග, ආගම් හා භාෂා ඇති වීම.
- බටහිර ජාතීන්ගේ පැමිණීමත් සමග ඔවුන්ගේ විවිධ සංස්කෘතික අංග ජන සමාජයට මිශ්‍ර වීම.

### ක්‍රියාකාරකම

4.3 සිතියම අධ්‍යයනය කරමින් පහත සඳහන් ප්‍රකාශවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(බෙංගාල, ඉන්දියන්, මන්නාරම්, පෝක්, ආසියාව)

1. ශ්‍රී ලංකාව අයත් වන්නේ විශාල ම මහාද්වීපය වූ ......................... ට යි.
2. ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් අතර ......................... බොක්ක පිහිටා ඇත.
3. ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් වෙන්වන්නේ ......................... සමුද්‍ර සන්ධියෙනි.
4. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ............................. සාගරයෙහි ය.
5. ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පිහිටා ඇති මුහුදු ප්‍රදේශය ......................... බොක්ක නමින් හැඳින්වේ.

## ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම

රටක සාපේක්ෂ පිහිටීම (relative location) යනු එම රට, අවට රටවල්, මහාද්වීප, මුහුදු හා සාගරවල පිහිටීම සමග සම්බන්ධ කර හඳුනා ගැනීම යි.

**ඒ අනුව ශ්‍රී ලංකාව,**


- ආසියා මහාද්වීපයේ දකුණින් ද
- ඉන්දියන් සාගරයේ උතුරින් ද
- ගිනිකොන දිග ආසියාවට බටහිරින් ද
- අප්‍රිකානු මහාද්වීපයට නැගෙනහිරින් ද පිහිටා තිබේ. (4.2 සිතියම)




**4.2 සිතියම**
**ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම**

**ක්‍රියාකාරකම**

ඔබ පාසලේ ඇති ආදර්ශ ගෝලය (globe) ආධාර කරගනිමින් ඉහත සඳහන් කරුණු අධ්‍යයනය කරන්න.




**4.3 සිතියම**
**ලෝක සිතියම ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම**

### ක්‍රියාකාරකම


ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව පිහිටීම නිසා මෙරට ජන සමාජයේ ඇති වූ වෙනස්කම් සඳහන් කරන්න.

## ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන

වර්තමාන ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ වේගයෙන් දියුණු වන රටකි. ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍රවල සිදු වන ප්‍රගතිය එයට හේතු වී ඇත. මේ අතර කැපී පෙනෙන සංවර්ධන ව්‍යාපෘති කිහිපයකි.

- නව වරායන්, නව ගුවන් තොටුපළවල් හා අධිවේගී මාර්ග (express ways) ඉදිවීම
- නාගරික සංවර්ධනය


ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන කිහිපයක් පිළිබඳ තොරතුරු පහත සිතියමෙන් දැක්වේ.




**4.4 සිතියම**
**ශ්‍රී ලංකාවේ වැදගත් ස්ථාන**



4.1 රූපය
ශ්‍රී ලංකාවේ දක්ෂිණ අධිවේගී මාර්ගය





4.5 සිතියම
කොළඹ - මාතර, කොළඹ - කටුනායක
අධිවේගී මාර්ගය

## ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
   - මත්තල හා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් (International airports)
   - කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල හා හම්බන්තොට වරායන්
   - ගාල්ල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, කුරුණෑගල, යාපනය, මහනුවර හා කොළඹ නගර
2. "ශීඝ්‍රයෙන් දියුණු වන ශ්‍රී ලංකාව" යන මාතෘකාව යටතේ කෙටි විස්තරයක් ලියන්න.

## ලෝකයේ වෙනත් දූපත්

විවිධ ප්‍රමාණයේ දූපත් විශාල සංඛ්‍යාවක් ලෝකය පුරා පිහිටා ඇත. එවැනි දූපත් කිහිපයක් සහ ඒවායේ විශාලත්වය 4.6 සිතියමෙන් දැක්වේ.




මූලාශ්‍රය - *http://en.wikipedia.org /21/07/2014*

**4.6 සිතියම**

**ලෝකයේ දූපත් කිහිපයක් හා ඒවායේ විශාලත්වය**

## ක්‍රියාකාරකම්

1. 4.6 සිතියම නිරීක්ෂණය කොට එහි දක්වා ඇති දූපත් ලෝක ආකෘති සිතියමක ලකුණු කොට නම් කරන්න.

2. විශාලත්වය අනුව එම දූපත් පෙළගස්වා ඉදිරියෙන් විශාලත්වය සටහන් කරන්න.

## පැවරුම

සිතියම් පොතක් ආධාරයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| දූපතේ නම | පිහිටා ඇති සාගරය |
|---|---|
| ජපානය | |
| නවසීලන්තය | |
| මාලදිවයින | |
| අයිස්ලන්තය | |
| බ්‍රිතාන්‍ය | |
| සීෂෙල්ස් | |

### පාරිභාෂික වචන

- දූපත — Island - தீவு
- සාපේක්ෂ පිහිටීම — Relative location - சார்பமைவிடம்
- සමුද්‍ර සන්ධිය — Strait - நீரிணை
- මෝසම් සුළං — Monsoon winds - பருவக்காற்றுக்கள்
- උප මහාද්වීපය — Sub Continent - துணைக் கண்டம்
- සංක්‍රමණ — Migration - இடப்பெயர்வு
- ආදර්ශ ගෝලය — Globe - பூகோளம்
- අධිවේගී මාර්ග — Express ways - அதிவேகப்பாதைகள்
- කේන්ද්‍රස්ථානය — Centre - மையம்
- වාරි ශිෂ්ටාචාරය — Hydrulic civilization - நீரியல் நாகரிகம்
- වාණිජ මධ්‍යස්ථානය — Commercial centre - வர்த்தக மையம்
- ආර්ථික මධ්‍යස්ථානය — Economic centre - பொருளாதார மையம்;
- ජාත්‍යන්තර වරාය — International harbour - சர்வதேச துறைமுகம்
- ප්‍රදීපාගාරය — Lighthouse - வெளிச்ச வீடு